# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1646/19 - 2010 මාර්තු 24 වැනි බදාදා - 2010.03.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. - බී. 11/80.

**1980 අංක 26 දරන ආහාර පනත**

ආහාර උපදේශක කමිටුව විමසා, 1980 අංක 26 දරන ආහාර පනතේ 32 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ සහ පෝෂණ අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

නිමල් සිරිපාල ද සිල්වා,
සෞඛ්‍ය ආරක්ෂණ සහ පෝෂණ අමාත්‍යවරයා.

2010 මාර්තු මස 16 වැනි දින,
කොළඹ,
සෞඛ්‍ය ආරක්ෂණ සහ පෝෂණ අමාත්‍යාංශයේ දී ය.

නියෝග

**2010 ආහාර (මත්ස්‍යයින් තුල අඩංගු ෆෝමැල්ඩිහයිඩ්) නියෝග**

1. මේ නියෝග 2010 ආහාර (මත්ස්‍යයින් තුල අඩංගු ෆෝමැල්ඩිහයිඩ්) නියෝග යනුවෙන් හඳුන්වනු ලබන අතර 2010 ජූලි මස 01 දින සිට බලාත්මක වන්නේ ය.

2. කිසිම තැනැත්තකු විසින් මි. ග්‍රෑ./කි.ග්‍රෑ. (පී.පී.එම්.) 5ක් ඉක්මවන ෆෝමැල්ඩිහයිඩ් ප්‍රමාණයක් අන්තර්ගත මත්ස්‍යයින් ශ්‍රී ලංකාවට ආනයනය කිරීම, ප්‍රවාහනය, බෙදාහැරීම, ගබඩා කිරීම, විකිණීම, විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම හෝ ඉදිරිපත් කිරීම නොකළ යුතු ය.

3. මත්ස්‍යයින් මෙරටට ආනයනය කරන සෑම තැනැත්තෙකු විසින්ම, අවස්ථාවෝචිත පරිදි, සම්භවිත රටේ හෝ ආනයනය කරනු ලබන රටේ අදාල ජාතික අධිකාරිය විසින් එම මසුන් මෙම නියෝගවල නිශ්චිතව දක්වා ඇති ෆෝමැල්ඩිහයිඩ් අනුප්‍රමාණයන්ට අනුකූලවන බවට ප්‍රකාශ කරමින් නිකුත් කරන ලද අනුකූලතා සහතිකයක් එම මසුන් රට තුලට ගෙන්වනු ලබන අවස්ථාවේ දී, ඉදිරිපත් කල යුතුය.

04 - 254

1A - G 12660— 3830 (2010/03)    ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.